PRILS LAZIO - PIANO REGIONALE D'INTEGRAZIONE LINGUISTICA E SOCIALE DEGLI STRANIERI NEL LAZIO
Progetto cofinanziato da
UNIONE EUROPEA
REGIONE LAZIO
MINISTERO DELL'INTERNO
Fondo europeo per l'integrazione di cittadini di paesi terzi

# ඉතාලි පුරවැසියකු වීම සඳහා සිවිල් නීතිය, ඉතාලි සමාජය පිළිබඳ පාඨමාලාව


















ASAP
Agenzia per lo Sviluppo delle Amministrazioni Pubbliche
Ministero dell'Istruzione, dell'Università e della Ricerca
USRLAZIO
Ufficio Scolastico Regionale
ROMA TRE
UNIVERSITÀ DEGLI STUDI
scuolemigranti

# පටුන


1 පරිච්ඡේදය - ඉතාලිය පිළිබඳ කෙටි හැඳින්වීම

2 පරිච්ඡේදය - ඉතාලිය තුල පවතින නීති මලාව

3 පරිච්ඡේදය - ජනගහනය පිළිබඳ සංඛ්‍යාමය දත්ත

4 පරිච්ඡේදය - රජයේ ආයතන

5 පරිච්ඡේදය - පලාත් පාලන ව්‍යුහය

6 පරිච්ඡේදය - ඔබේ පවුල (කුටුම්බය)

7 පරිච්ඡේදය - රැකියාව සඳහා පවතින නීති මාලාව


scuolemigranti

8 පරිච්ඡේදය - අධ්‍යාපන ක්‍රමවේදය, ප්‍රායෝගික පුහුණු සහ වැඩිහිටි අධ්‍යාපනය

9 පරිච්ඡේදය - සෞඛ්‍ය සේවා පද්ධතිය

10 පරිච්ඡේදය - ඉතාලි භූමිය තුල වලංගු ලේඛන

11 පරිච්ඡේදය - නිවාස සහ මුදලට සහ බද්දට ගැනීම

12 පරිච්ඡේදය - සමාජ සුරකුම් ක්‍රමවේදය

13 පරිච්ඡේදය - බදු ක්‍රමවේදය

14 පරිච්ඡේදය - ඒකාබද්ධ වීමේ ගිවිසුම සහ ඉතාලිය තුල නීත්‍යානුකූලව රැඳී සිටීමේ බලපත්‍රය (Permesso di Soggiorno)

15 පරිච්ඡේදය - පුරවැසි භාවය

scuolemigranti



# 1 පරිච්ඡේදය

## ඉතාලිය පිළිබඳ කෙටි හැඳින්වීම

# ඉතාලිය පිළිබඳ කෙටි හැඳින්වීම

එංගලන්තයේ සිට ඊජිප්තුව දක්වා ද පෘතුගාලයේ සිට මෙසපොතේමියාව (වර්තමාන ඉරාකය) දක්වා ද විහිදී පැවතුනු ඉතා පැරණි ඉතිහාසයක් ඇති **රෝමණු අධිරජ්‍යයේ** අගනුවර **රෝමය** විය.






scuolemigranti

රෝමණු අධිරජ්‍යයේ රාජ්‍ය භාශාව ලතින් භාශාව විය. වර්තමානයේ පවතින ඉතාලි, ස්පාඤ්ඤ, ප්‍රංශ, පෘතුගාල් හා රුමේනියන් යන භශාවන්, ලතින් භාශාවෙන් නිර්මාණය වූ භාශාවන් වේ.



විශිෂ්ඨ ගනයේ ලේඛකයන් (එනම් Dante, Petrarca සහ Boc-caccio) බිහිවූ 1300 කාල පරිච්චේදය ඉතාලි භශාවේ 'ස්වර්ණමය යුගය' ලෙස හඳුන්වයි.

**Dante Alighieri**, 'Divina Commedia' කෘතියෙහි කතෘ වන ඔහු, **ඉතාලි භාශාවේ පියා** ලෙස හන්දුන්වයි.

1861 වනතුරු ඉතාලිය ජනපද කිහිපයකට බෙදා පැවතුනි. සමහර ජනපද විදේශ රාජ්‍යයන් විසින් පාලනය කරන ලදී. (Austria, Spain, France)

**1861** : ඉතාලි රජයක් ආරම්භ කරන ලදී. නමුත් රෝම නගරය, පාප් තුමන් විසින් පාලනය කරන ලද වතිකානු රාජ්‍යයේ අගනුවර ලෙස පැවතිනි.



**1870 :** රෝමය ඉතාලි රජ්‍යයේම කොටසක් ලෙස සැලකූ අතර එය නව අගනුවර ලෙස නම් කරන ලදී.

**1861 - 1922 :**

ඉතාලි ආණ්ඩුවේ පාර්ලිමේන්තුව, රජ වරුන් විසින් පාලනය කරන ලදී. එහි පළමු රජ වූයේ සවොයියා නැමති රජ පවුලට අයත්, වින්තෝරිඔ එම්මානුඑලෙ II (Vittorio Emanuele II) නම් වූ රජ තුමාය.



1922 - 1943 :

ඉතාලිය තුල, පැසිස්ට් වාදියකු යටතේ ඒකාධිපති පාලනයක් පැවතුනි.

එම රජයය පාලනය තුල, මහජනතාවට කථා කිරීමේ, ප්‍රවෘත්ති නිකුත් කිරීමේ, සාමුහිකව රැස්වීමේ නිදහසක් **නොපැවතුනි.**





scuolemigranti

දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉතාලිය ප්‍රජාතන්ත්‍ර වාදී රාජ්‍යයක් බවට පත්විය.

සර්වජන ඡන්ද බලය හඳුන්වා දෙන ලදී. : සෑම ගැහැණු සහ පිරිමි පුරවැසියකුටම තමන් කැමති අයකුට ඡන්දය දීමට අයිතිය ලැබුනි.

**1946 :**

ජනමත විචාරනයක් මගින් ඉතාලි පුරවැසියන් , රජ පරපුරේ පාලනය අවසන් කල යුතු බව තීරණය කල අතර එහිදී නව ඉතාලි සමූහ ආණ්ඩුව **(Repubblica Italiana)** පත්කර ගන්නා ලදී.



# 2 පරිච්ඡේදය

# ඉතාලිය තුල පවතින නීති මලාව

scuolemigranti

# ඉතාලියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1947 දී ප්‍රධාන රාජ්‍ය නීතිය අනුමත කරන ලදී.

ඉතාලිය තුල සියළුම නීතීන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලධර්ම හා වටිනාකම් වලට අනුකූල විය යුතුයි.





La Costituzione, munita del sigillo dello Stato, sarà inserita nella raccolta ufficiale delle leggi e dei decreti della Repubblica.

La Costituzione dovrà essere fedelmente osservata come Legge fondamentale della Repubblica da tutti i cittadini e dagli organi dello Stato.

*Data a Roma, addì 27 dicembre 1947.*

*CONTROFIRMANO:*

*Il Presidente dell'Assemblea Costituente*

*Il Presidente del Consiglio dei Ministri*

Visto, il Guardasigilli:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, වගන්ති 139 කින් සමන්විත වන අතර ඒවා ප්‍රධාන කොටස් දෙකකට බෙදා තිබේ.

- රජයේ ප්‍රධාන මූලධර්ම හා පුරවැසියන්ගේ අයිතිවාසිකම්, යුතුකම් පළමු කොටසින් විස්තර කරයි.
- සමූහාණ්ඩුවේ නීති එනම් රාජ්‍ය ව්‍යුහය සහ සංස්ථායික සංඛ්‍යා දෙවන කොටසින් විස්තර කරයි.



**සංස්ථායික සංඛ්‍යා** : සෙනට් සභාව, සමූහාණ්ඩුවේ ජනාධිපති, ආණ්ඩුව සහ අධිකරන මණ්ඩලය

scuolemigranti

Art.1 ඉතාලිය රැකියා මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකි.

Art.2 ඉතාලි සමූහාණ්ඩුව තනි පුද්ගලයකුගේ හෝ සමාජයේ කණ්ඩායම් වල මානුෂික අයිතිවාසිකම් පිළිගන්නා අතර ඒවා උල්ලංඝනය නොකිරීමට ප්‍රතිඥා දෙයි.

Art.3 නීතිය ඉදිරියේ සෑම අයකුම සමානව සලකන අතර, ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, භාෂාව, ආගම, දේශපාලන මත සහ පෞද්ගලික හෝ සමාජ තත්ත්වය අනුව වෙනසක් නොදක්වයි.

Art.8 සියළුම ආගම් සඳහා එක සමානව, ස්වාධීනව කටයුතු කිරීමට නීතිය ඉදිරියේ ඉඩකඩ සලසා දී ඇත.

scuolemigranti
Rete delle scuole di italiano

Art.10 සාධනීය හේතු මත තම රටින් පිටුවහල් කරන ලද විජාතිකයකුට, ඉතාලි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ලබා දෙන අතර, එම පුද්ගලයාට නීතියේ කොන්දේසි වලට අනුගතව සමූහාණ්ඩුවට අයත් භූමි භාගය තුල ආරක්ෂා සහිත ස්ථානයක් ඉල්ලා සිටීමට අයිතියක් ඇත.

scuolemigranti

Art.11 පුද්ගලයන්ගේ නිදහසට බාධා වන, ආරවුල් ඇතිවීමට මුල් වන, යුද්ධ සහ ජාත්‍යන්තර ආරවුල් ප්‍රතික්ෂේප කරයි.

Art.13 පුද්ගලික නිදහසට පීඩා නොකළ යුතුය. පුද්ගලික නිදහස සීමා කිරීමට, අධිකරණය විසින් නිකුත් කරන ලද වරෙන්තුවකට සහ නීතිය තුල විස්තර කර ඇති තත්ත්වයකට හැර, අවසර නොමැත.

scuolemigranti

Art.15 සියළුම ලියකියවිලි වල සහ අනෙකුත් සන්නිවේදන මාර්ග වල නිදහස සහ රහස්‍ය භාවය නොකෙලසිය යුතුය.

Art.17 රටවැසියාට නිරායුධව, සාමකාමීව එක්රැස්ව කටයුතු කිරීමට අයිතියක් ඇත.

scuolemigranti

Art.21 සියළුම දෙනාට ඔවුන්ගේ අදහස් ඕනෑම මාධ්‍යක් හරහා ප්‍රචාරය කිරීමට අයිතියක් ඇත. සංනිවේදන මාධ්‍යයන්ට ඒ සඳහා අනුබල දීමට හෝ වාරනය කිරීමට දායක විය නොහැක.

Art.38 රැකියාවක් කිරීමට නොහැකි සහ ජීවත් වීමට ආදායම් මාර්ගයක් නොමැති ඕනෑම පුරවැසියකුට සුභසාධක ආධාර ඉල්ලා සිටීමට අයිතියක් ඇත.

scuolemigranti

Art.48 වයස සම්පූර්ණ වූ ගැහැනු සහ පිරිමි දෙපාර්ශවයටම ඡන්ද දායකත්වය හිමිවේ.

Art.51 සියළුම පුරවැසියන් හට (ගැහැනු සහ පිරිමි දෙපාර්ශවයටම) රාජ්‍ය ආයතන වල සහ ඡන්දයෙන් පත්වන තනතුරු දැරීමට සුදුසුකම් ඇත.

scuolemigranti

# මහජන අයිතිවාසිකම්

- තමන්ට රිසි සේ සැරි සැරීමට, සංගම් ආශිතව කටයුතු කිරීමට, සාමුහිකව රැස් වී කටයුතු කිරීමට, තමන්ගේ හෘද සාක්ෂියට හා ආගමානුකූලව කටයුතු කිරීමට, පුද්ගලික නිදහස ඇත.




- නීතිය ඉදිරියේ සෑම අයකුම සමානාත්මකතාවයෙන් සලකනු ලබයි.
- තමන්ගේ නිර්දෝෂභාවය කියාපෑමට හිමිකමක් ඇත.
- තමන්ගේ මුලික දේපල සම්බන්ධව, පුද්ගලයන් අතර පෞද්ගලික එකඟතාවයන්ට පැමිනීමට අයිතියක් නැත.
- පුරවැසිභාවය සඳහා සුදුසුකම් ඇත.

scuolemigranti

# දේශපාලන හිමිකම්

රාජ්‍ය පාලනය සඳහා පුරවැසියන්ගේ දායකත්වය මෙයට අදාල වේ.

මේ සඳහා සහභාගි විය හැකි ක්‍රම විධි;

- ඍජුව : ජනමත විචාරන, පෙත්සම් වැනි ලිඛිත ආයාචන මගින් .
- වක්‍රව : නියෝජිතයන්ට ලබාදෙන ඡන්ද මාර්ගයෙන් .



# සාමාජීය හිමිකම්

- රෝගී, වයස්ගතවීම, විරැකියාව වැනි අවස්ථාවන් හිදි රැකවරනය පැතීමට හිමිකමක් ඇත.
- මනා සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට හිමිකමක් ඇත.
- අධ්‍යාපනය ලබා ගැනීමට හිමිකමක් ඇත.
- රැකියාවක් කිරීමට හිමිකමක් ඇත.තවත් එවැනි දේ. . . . . .








# 3 පරිච්ඡේදය

## ජනගහනය පිළිබඳ සංඛ්‍යාමය දත්ත

# ජනගහනය පිළිබඳ සංඛ්‍යාමය දත්ත

2011 ජනවාරි වන විට මුළු ජනගහනය : **60.600.000**

එයින් ස්ථිර පදිංචි විදේශ සංක්‍රමිකයන් ගණන :



**මුළු පිරිමි : 48.5 %**

**මුළු ගැහැණු : 51.5 %**

විවාහක අවිවාහක බව පිළිබඳ තොරතුරු :

| | | |
|---|---|---|
| විවාහක | : | 29.890.000 |
| දික්කසාද | : | 1.185.000 |
| කණවැන්දුම් ස්ත්‍රීන් හා පුරුශයන් | : | 4.550.000 |

# ඉතාලිය තුල වෙසෙන ප්‍රධාන ජන කොට්ඨාශ




scuolemigranti



# 4 පරිච්ඡේදය

## රජයේ ආයතන



scuolemigranti

# ප්‍රජාතන්ත්‍රවාදය

ඉතාලිය **ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකි.**

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ 2 කි.



- ජනතා ස්වෛරීභාවය.
- ස්වාධීනත්වය සහ සමානාත්මකතාවයේ මූලික මූලධර්මයන් ක්‍රියාවට නැංවීම.

# රජයේ බලතල

රජයේ බලතල වර්ග තුනකි.

**ව්‍යවස්ථාදායක බලය**

**විධායක බලය**

**අධිකරණ බලය**

මෙම බලතල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීති රීති සීමාවන් තුල, එකිනෙකකින් වෙන්ව ස්වායත්තව ක්‍රියා කරයි.

## ව්‍යවස්ථාදායක බලය

- නීති සෑදීමේ බලය ඇත.
- පාර්ලිමේන්තුවේ ක්‍රම වේදයන් අනුව ක්‍රියාත්මක වෙයි.

රජයේ නීති රීති, පාර්ලිමේන්තුවට යෝජනා කරන අතර ඒවා සම්මත කරනු ලබයි

මෙය මණ්ඩල 2 කින් සමන්විත වෙයි.

- නියෝජ්‍යය මණ්ඩලය *«Camera dei deputati»*
- සෙනට් මණ්ඩලය *«Senato»*



සෑම වසර 5 කට වරක් ඡන්දය පවත්වනු ලැබේ.

## විධායක බලය

- නීති රීති සඳහා බලපෑම් කිරීමට බලය ඇත.
- රජයට විශ්වාස පක්ෂව කටයුතු කරයි.

රජය විසින් පාර්ලිමේන්තු තීරණ ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරයි.

මෙහි අන්තර්ගතය නම්:

- අග්‍රාමාත්‍යවරයා (රජයේ ප්‍රධානියා) මන්ත්‍රීවරුන් පත් කිරීම සහ සම්බන්ධීකරනය කරනු ලැබේ.
- සෑම අමාත්‍යාංශයක්ම පාලනය සඳහා මන්ත්‍රීවරයකු සිටියි.

උදා: කම්කරු, අභ්‍යන්තර කටයුතු, සෞඛ්‍යය, විදේශ කටයුතු ආදි අමාත්‍යාංශ.......

scuolemigranti

# අධිකරණ බලය




- නීති සඳහා බලපෑම් කිරීමට බලය ඇත, වැරදිකරුවන් හට දඬුවම් නියම කිරීම, මිනිසුන්ගේ වැරදි, නිවැරදි භාවය තහවුරු කිරීම.
- විනිශ්චය කරුවන් (මහේස්ත්‍රාත්) හට බලය පවරා දෙයි.

විනිශ්චය කරුවන්, නීති රීති ක්‍රියත්මක කර ඇති ආකාරය සහ වර්තමානයේ ක්‍රියත්මක වෙමින් පවතින ආකාරය නිරීක්ෂනය කරයි.

උත්තරීතර මහෙස්ත්‍රාත් කවුන්සිලය «Consiglio Superiore della Magistratura (C.S.M.)» යනු අධිකරණ මණ්ඩලයේ ස්වාධීන පාර්ශවයකි.
එය, රජයේ අනෙක් බලතල දෙවර්ගයේ ස්වාධීනත්වය තහවුරු කරයි.



අධිකරණය හා රජය, පාර්ලිමේන්තුවට අමතරව ඉතා වැදගත් සංස්ථාපිත ආයතනයන් වේ.

## ජනරජයේ ජනාධිපති

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ වග කියනු ලබන්නා වෙයි.
- තම රට නියෝජනය කරමින් අනෙකුත් රටවල් සමඟ මිත්‍ර සම්බන්ධතා ගොඩ නගා ගනියි.
- ජනාධිපතිවරණය සඳහා සෑම වසර 7කට වරක්ම ඡන්දය පවත්වයි.



ජනරජයේ වර්තමාන ජනාධිපති Giorgio Napolitano වේ.

# La Corte Costituzionale

- ඉල්ලීමක් කල විට, පවතින නීති, ව්‍යවස්ථාවලිය ට අනුකූල දැයි තීරනය කරයි.
- නීතිය ව්‍යවස්ථාව හා නොගැලපේ නම්, la Corte Costituzionale මගින් එය අවලංගු කරනු ලැබේ.





scuolemigranti

# පරිපාලනය - L’Amministrazione

පරිපාලනයේ කොටස් කරුවන් :

- මහජනයාගේ අවශ්‍යතා තහවුරු කරීමට, ජනරජයේ භූමි භාගය තුල විසිරී ඇති සියළුම කාර්යාල නිළධාරීන්.
- ඇමතිවරු.
- අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීමට යොදවා ඇති පොලිස් නිළධාරීන්.



# යුධ හමුදාව

- බාහිර සතුරු කරදර වලින් ආරක්ෂා කර ගැනීම, හමුදාව සතු වගකීම වේ.
- යුධ හමුදා වේ කොටස් කිහිපයක් ඇත.
  - ඉතලියානු හමුදාව *«l’Esercito Italiano»*
  - නාවික හමුදාව *«la Marina Militare»*
  - ගුවන් හමුදාව *«l’Aeronautica Militare»*
  - කරබිනිඑරි (පොලිස්) හමුදාව *«l’Arma dei Carabinieri»*





scuolemigranti

# මහජන ආරක්ෂාව

මහජන ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කරන සංවිධාන සහ පුද්ගලයන්.

සෑම පළාතකම මේවා පවතියි.

| | |
|---|---|
| නායකයා<br>*un prefetto* | ප්‍රදේශය තුල රජය නියෝජනය කරන්නා වේ.මොහු ඉතා ඉක්මනින් අවශ්‍ය නීතිය ක්‍රියාත්මක කරයි. |
| පාලකයා<br>*un questore* | පලාත් තුල ඇති සියළුම පොලිසීන් සම්බන්ධිකරණය කරයි. |

ප්‍රයෝජනවත් දුරකථන අංක :

**112 Carabinieri 113 Polizia**

scuolemigranti



# 5 පරිච්ඡේදය

# පලාත් පාලන ව්‍යුහය

# ප්‍රදේශය තුල ඇති සංවිධාන

| දිසාව | පලාත | නගරය |
|---|---|---|
| REGIONE | PROVINCIA | COMUNE |






# දිසාව

ප්‍රාන්ත හෙවත් දිසා 20 ක් ඇත.

ඔවුන් සොයා බලනු ලබන්නේ : සෞඛ්‍යය, ප්‍රවාහන පද්දතිය, ජලය, බල ශක්තිය, රැකියා, වෘත්තීය පුහුණු කටයුතු.

ඔවුන්ට නීති සම්පාදනය කල හැක.

සෑම වසර 5කට වරක් ඡන්දයක් පවත්වනු ලැබේ.

සෑම දිසාවකම නගරාධිපති වරයකු «Governatore» සහ දිසා කවුන්සිලයක් «Consiglio Regionale» ඇත.

# පළාත

පළාත් 110 ක් ඇත. නමුත් එය 51 ක් කිරීමට අපේක්ෂිතයි.

ඔවුන් සොයා බලනු ලබන්නේ : දෙවන ශ්‍රේණියේ ජේශ්ඨ පාසල් අධ්‍යාපනය, පරිසරය, කැලිකසල, මහා මාර්ග, මහජන ආරක්ෂාව, බල ශක්තිය ආරක්ෂා කිරීම.

සෑම වසර 5 කට වරක් ඡන්දයක් පවත්වනු ලැබේ.

සෑම පළාතකම සභාපති වරයකු «Presidente» සහ පළාත් සභාවක් «Consiglio Provinciale» ඇත.

# නගරය

නගර 8092 ක් ඇත.

ඔවුන් සොයා බලනු ලබන්නේ :සමාජ සේවා, බිළිදු පාසල්, පෙර පාසල්, ප්‍රාථමික සහ කනිෂ්ඨ පාසල් අධ්‍යාපනය හැදෑරීමට ඇති අයිතිවාසිකම් පිළිබඳව හා ඒවායේ ඉදිකිරීම් කටයුතු, පුද්ගල ලියාපදිංචි කිරීම්, මිනී කනතු නඩත්තුව, නගර පරිපාලනය, නිවාස ඉදිකිරීම් වල ප්‍රමිති සහතික කිරීම, ගමනා ගමනය, වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම,සංස්කෘතිය, විදුලි බල පද්දතිය නිරීක්ෂනය ආදියයි.

සෑම වසර 5 කට වරක් ඡන්දයක් පවත්වනු ලැබේ.

සෑම නගරයකම පුරපති «Sindaco» සහ නගර සභාවක් «Consiglio Comunale» ඇත.

මේ සියළු දෙනා (දිසාවේ නගරාධිපති «Governatore», පලාතේ සභාපති «Presidente», නගරයේ පුරපති «Sindaco» සහ දිසා, පලාත්, නගර කවුන්සිලයන්) පත් කරනු ලබන්නේ මහජන ඡන්දයෙනි.



සෑම පලාතකම ආරක්ෂාව තහවුරු කිරීම සඳහා, ඉතාම සුදුසු පුද්ගලයකු රජය විසින් පත් කරනු ලබයි. ඔහු/ඇය අවශය කටයුතු ඉතා ඉක්මනින් ක්‍රියාවට නැංවිය යුතුය.

# ප්‍රාන්ත හෙවත් දිසා «regioni» දක්වන සිතියම

ඉතාලිය ප්‍රාන්ත හෙවත් දිසා 20 කට බෙදා ඇත.




සෑම ප්‍රාන්තයකටම ප්‍රධාන නගරයක් «capoluogo» ඇත.

උදා: පිඑමොන්තෙ ප්‍රාන්තයේ ප්‍රධාන නගරය, තොරීනො වේ.

සෑම ප්‍රාන්තයක්ම 'පළාත්' වලට නැවත බෙදා ඇත.

උදා: කම්පානියා යන ප්‍රාන්තය, පළාත් 5 කට න්වත බෙදා ඇත. එනම් අවෙල්ලීනො, බෙනෙවෙන්තො, කසෙර්තා, නාපොලී සහ සලෙර්නෝ වේ.

scuolemigranti

# ලාත්සිඔ ප්‍රාන්තය - La regione Lazio

පදිංචිකරුවන් ගණන : 5.775.000
එයින් විදේශිකයන් ගණන : 615.000




ජනගහනය අතින් ලාත්සිඔ ප්‍රාන්තය, ලොම්බාර්දිආ සහ කම්පානිආ ප්‍රාන්තවලට පමණක් කුඩා වන අතර, තුන්වන ස්ථානය හිමිකර ගනියි.

**ලාත්සිඔ ප්‍රාන්තය, පරිපාලන පළාත් 5කට බෙදා තිබේ.**

- Frosinone (91 comuni)
- Latina (33 comuni)
- Rieti (73 comuni)
- Roma (121 comuni)
- Viterbo (60 comuni)

scuolemigranti

# ලාත්සිඔ හී වාසය කරන යුරෝපා හවුලේ රටවලට අයත් බහුතරයක් වූ විදේශික ජනතාව.





# ලාත්සිඔ හී වාසය කරන යුරෝපා හවුලේ රටවලට අයත් නොවන බහුතරයක් වූ විදේශික ජනතාව.





# රෝම නගරය



පදිංචිකරුවන් ගණන : 2.743.796
එයින් විදේශිකයන් ගණන : 294.000

මිලානෝ නගරයට පසු වැඩිපුරම විදේශිකයන් ගණනක් පදිංචි නගරය රෝමය වේ.



ඉතාලියේ අගනුවර මෙය වේ. ඉතාලි ජනාධිපති තුමාගේ පදිංචිය, ආණ්ඩු පාලනය සහ පාර්ලිමේන්තුව රෝමය තුල වේ.

වතිකානු රාජ්‍යය ද මේ තුල පිහිටා ඇත.

scuolemigranti

# රෝම නගරය තුල ඇති නගර සභා ප්‍රදේශ




රෝම නගර සීමාව, නගර සභා ප්‍රදේශ «*Municipi*» 15 කට වෙන්කර ඇත.

සෑම නගර සභාවකටම, සභපති වරයකු «*Presidente*» සහ මන්ත්‍රීන් 4-6 දෙනෙකුගෙන් පමණ සමන්විත මණ්ත්‍රණ සභාවක් «*Giunta*» ඇති

මහ නගර සභා ඡන්දය සමඟ, මෙහි ද සෑම වසර 5කට වරක්ම ඡන්දය පැවැත්වෙයි.




## නගර සභාවේ කාර්යයන් :

- මහජන සේවය.
- සමාජ සුභසාධන කටයුතු.
- පාසල් සහ අධ්‍යාපනික සේවා.
- සංස්කෘතික කටයුතු සහ ඊට අදාල සේවා, ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම්.
- නගර සංවර්ධනය, සංස්කෘතික උරුමයන් කලමනාකරණය සහ නීති සම්පාදනය.
- සුළු කර්මාන්ත හා වානිජ්‍යය යන ක්ෂෙත්‍රයන් හී සංවර්ධනය සඳහා මුල පිරීම.
- නගර පොලිසියේ කටයුතු සිදු කිරීම.



# 6 පරිච්ඡේදය

# ඔබේ පවුල (කුටුම්බය)

# පවුලක් යනු කුමක්ද?

ඉතාලි ව්‍යවස්ථාවට අනුව, පවුල යනු **විවාහය පදනම්** වූ නිරායාසයෙන්ම ඇතිවන්නාවූ සංසදයකි.

දරුවන් නොමැති වුවත්, විවාහක යුවලක්, පවුලක් ලෙස සලකනු ලැබේ.



scuolemigranti

විවාහක යුවල් හැරුනු විට ඉතාලිය තුල විවහ නොවූ පවුල් රාශියක් දක්නට ලැබේ.




මෙලෙස එකතුවීම් හඳුන්වනු ලබන්නේ :

අවිවාහක යුවල් «Coppie di fatto» : දරුවන් නොමැති නම්.
අවිවාහක පවුල් «Famiglie di fatto» : දරුවන් ඇතිනම්.



# විවාහකයන් හට ලැබෙන හිමිකම්

- සහවාසය : පක්ෂපාතීත්වය, අන්‍යෝන්‍ය සහයෝගීතාව, වැනි තවත් දෑ...

- නිවස : විවාහ යුවලට එකට ජීවත් වීමට අයිතිය ක් ඇත. (එක් පාර්ශවයක් නිවසින් නෙරපා හැරීමට නොහැකිය)

**අසනීප අවස්ථාවකදී**

රෝහල කරා රැගෙන යාමට, එම පුද්ගලයා ගැන තීරණ ගැනීමට, ඔහු/ඇය පිළිබඳ තොරතුරු දැන ගැනීමට, වැනි දෑ සඳහා අයිතියක් ඇත.....

## මරණයකදී

විශ්‍රාම වැටුප , TFR, කුලී නිවස, උරුමයෙන් ලැබෙන දෑ වැනි තවත් දෑ සඳහා අයිතිය ලැබේ.

## වෙන්වීමකදී

වන්දියක් සහ මුදල් උපකාරයක් (උසාවිය මගින් තීරණය කරන) ඉල්ලා සිටිය හැක.

වර්තමනයේ, විවාහක යුවලවල් සඳහා ලැබෙන වරප්‍රසාද, අවිවාහක යුවල් සඳහා නොලැබේ.

**දරුවන් සඳහා සම අයිතිවාසිකම් ඇත.**

දෙමාපියන් හටද එලෙසම තම දරුවන් කෙරෙහි යුතුකම් ඇත.

වෙන්වීමකදී, අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩ නැගීම සඳහා උසාවිය මැදිහත් වෙයි.

scuolemigranti

# විවාහය

විවාහය සමග ස්වාමිපුරුෂයාට සහ භාර්යාවට එක සමාන **අයිතිවාසිකම් සහ වගකීම්** හිමිවේ.

උදාහරණයක් ලෙස

පවුලේ අවශ්‍යතාවයන් වෙනුවෙන් එම දෙපලගේම දායකත්වය දැක්විය යුතුය. (වෘත්තීය ව හෝ ගෘහනියක් ලෙස) එකිනෙකාට විශ්වාස පක්ෂව ජීවත්වීම.

වෙන්වීමට හෝ දික්කසාදය සඳහා දෙපාර්ශවයටම ඉල්ලුම් කල හැක.

scuolemigranti

දේපල වෙන් වෙන්ව තබා ගන්නවාද නැතිනම් පොදුවේ තබා ගන්නවාද යන්න ඔබ දපලට තීරණය කල හැක.

- පොදුවේ තිබෙන්නාවූ දේපල :

  විවාහයෙන් පසු උපයන්නාවූ සියළුම වත්කම් නිරායාසයෙන්ම දෙපලටම අයිති වේ.

- වෙන් කරන ලද දේපල :

  විවාහය පවතින කාලය තුල උපයන්නාවූ දේපල දෙදෙනාගෙන් එක් එක් කෙනාට වෙන් වෙන්ව තනි තනි අයිතියේ තබා ගැනීම වෙයි.

scuolemigranti

# ඉතාලිය තුල විවාහ ගිවිස ගැනීම

විදෙශිකයන් ඇතුළු, ඉතාලිය තුල විවාහ ගිවිස ගන්නා ඕනෑම අයකු ඉතාලි නීතියට යටත් වේ.



- **විදේශිකයන් දෙදෙනෙකු** අතර විවාහය :

  අවම වශයෙන් එක් අයකුවත් ඉතාලිය තුල නීත්‍යානුකූලව වාසය කල යුතුය.

- **විදේශිකයකු හා ඉතාලි පුරවැසියකු** අතර විවාහය :

  විදේශිකයා හට පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ අවශ්‍යය නොවේ. නමුත් අනන්‍යතාවය පෙන්වීම සඳහා වලංගු ලියවිල්ලක් ඉදිරිපත් කල යුතුය. (ගමන් බලපත්‍රය)

- **විදේශිකයන් දෙදෙනාටම පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ හෝ ඉතාලිය තුල නීත්‍යානුකූලව වාසය කර නොමැතිනම්** ඔවුන්ගේ විවාහය සිදු කල හැක්කේ ඉතාලිය තුල පිහිටා ඇති ඔවුන්ගේ රටේ තානාපති කාර්යාලයේ දි හෝ කොන්සිලවරයකු ඉදිරියේය.



scuolemigranti

විදේශිකයා විවාහ වීමට පෙර, ඉතාලිය තුල රහසිගතව හෝ නීතිවිරුද්ධ ලෙස සිට ඇතත්, තම පවුල හා සමඟ නැවත එකතුවීම සඳහා ඔහුට/අයට **පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ සඳහා අයදුම් කල හැක.**

විවාහ වූ පමණින් ඉබේම **ඉතාලි පුරවැසිභාවය නොලැබේ.**

**ඉතාලි පුරවැසිභාවය ලැබා ගැනීම සඳහා :**
1) විවාහය අවම වශයෙන් අවු. 2ක් වත් පරණ විය යුතුය.
2) විදෙශිකයා, අවම වශයෙන් අවු. 2ක් වත් ඉතාලිය තුල **පදිංචි වී** සිටිය යුතුය. (විවාහ වූ පසු දරුවන් ලැබී ඇතිනම් කාලය අවු. 1කි.)



# දරුවන් සහ ගර්භනී බාවය.



සියළුම විදේශික **ගර්භනී කාන්තාවන්** හට, වෛද්‍යවරයකු මුණ ගැසීමට සහ පරීක්ෂණ (ලේ , ultrasound පරීක්ෂණ ආදිය) නොමිලේ කර ගැනීමට හිමිකම් ලැබේ.
ඇයට රජයේ රෝහලකට «ospedale» හෝ පවුල් සැලසුම් සායනයකට «consultori familiari pubblici» යාමට හැකියාව ඇත.



නිත්‍යානුකූලව හෝ රහසිගතව ඉතාලිය තුල වාසය කරන විදේශික ගර්භනී කාන්තාවන් හට **දරු ප්‍රසූතිය** සඳහා රෝහලකට යාමට හා භාර ගැනීමට අයිතියක් ඇත. එම කාලය තුල සහ දරු ප්‍රසූතියෙන් පසු ඇයට අවශ්‍යය වෛද්‍යය ආධාර ලබා ගැනීමට අයිතියක් ඇත.

**පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ** : ඇය රහසිගතව ඉතාලිය තුල වාසය කරන බවට වැරදිකරුවකු ලෙස වාර්ථා වී නොමැති නම් මෙය අවශ්‍යය නෙ

# දරුවන් සහ ඉපදීම

දරු උපත ලේඛනගත කිරීම අනිවාර්යය වේ.

- රෝහලේදි : දරුවා ඉපදී දවස් 3ක් ඇතුලත.
- නගර සභාව «Comune» තුල : දරුවා ඉපදී දවස් 10ක් ඇතුලත.
- මේ සඳහා දමාපියන්ගෙන් එක් අයකු පමණක් ප්‍රමාණවත් වේ. (දෙමාපියන් විවාහක නම්)
- මේ සඳහා දමාපියන් දෙදෙනාම එකවර අවශ්‍යය වේ. (දෙමාපියන් අවිවාහක නම්)

වෛද්‍යවරයාට, වින්නඹු තැනට (midwife) හෝ ඒ සඳහා උදව් වූ අයට, දරු උපත පිලිබඳව වාර්ථා කල හැක.

scuolemigranti

**පාසල** : දරුවාට මාස 4 ක් වූ පසු බිළිඳු පාසලකට «asilo nido» ඇතුලත් කල හැක. නමුත් දරුවා ඉපදීමට පෙර මේ සඳහා ලියාපදිංචි විය යුතුය.ගෙවිය යුතු මුදල පවුලේ ආර්ථික තත්ත්වය මත වෙනස් වෙයි. (ISEE).



**එන්නත් කිරීම** : මෙය දරුවන් සඳහා අනිවාර්යය වන අතර නොමිලේ ලබා දෙයි.

පළමු එන්නත මාස 3න් ලබා දෙනු ලැබේ.

ඉතාලිය තුල අනිවාර්යය එන්නත් නම්:
**ගලපටලය, පිටගැස්ම, පෝලියෝ, හෙපටයිටීස් B** වේ.

scuolemigranti



# 7 පරිච්ඡේදය

## රැකියාව සඳහා පවතින නීති මාලාව

scuolemigranti

# රැකියාව

**සෑම පුරවැසියකුටම** තමන්ගේ හැකියාව අනුව **රැකියාවක් කිරීමට අයිතියක් ඇත** .

මේ සඳහා, ජනරජය පහත දෑ සහතික කරයි.

- ප්‍රමාණවත් සහ සාධාරණ වේතනයක්.
- සතිපතා නිවාඩු සහ වාර්ශික නිවාඩු.
- ගැහැණු සහ පිරිමි සේවකයන් සමනාත්මකව සැලකීම.



scuolemigranti

- මාතෘත්වය වෙනුවෙන් ගැහැණු සේවිකවන් සඳහා විශේෂ රැකවරණය.
- ආබාධිත, වයස් ගත සහ රැකියා ස්ථානයේ දී අනතුරකට ගොදුරු වූ සේවක සේවිකවන් හට සහන.

1970 සිට අද දක්වා වලංගු 'සේවක ආඥා පනත' (Statuto dei lavoratori) සේවකයන්ගෙ මූලික අයිතිවසිකම් අර්ථ දක්වා ඇත.
'Contratti Collettivi Nazionali di Lavoro' ආයතනය සියළුම සේවක හිමිකම් සහ වගකීම් පාලනය කරනු ලබයි.
සෑම වර්ගයක් සඳහාම විශේෂිත කොන්ත්‍රාත්තුවක් ඇත. මෙම කොන්ත්‍රත්තු කලින් කලට ප්‍රතිසංස්කරණය කරන අතර, ඒවා ව්‍යාපාරික සංගම් හා වෘත්තිය සමිති සහතික කරයි.



රැකියා වර්ග තුනක් ඇත :



- අනායකු යටතේ රැකියාව කිරීම.
- කෙටිකාලීනව ව්‍යාපෘතිවල රැකියාව කිරීම.
- ස්වයං රැකියා.



scuolemigranti

## රැකියාව

- අන්‍යකු යටතේ රැකියාව කිරීම.

## කොන්ත්‍රාත්තු වර්ගය

- *A tempo determinato*

  තාවකාලික පත්වීම් - කොන්ත්‍රාත්තුව නිශ්චිත කාල වකවාණුවක අවසාන වේ.

- *A tempo indeterminato*

  ස්ථිර පත්වීම්. - කොන්ත්‍රාත්තුව අවසාන වීමට නිශ්චිත කාල වකවාණුවක් නොමැත.

## රැකියා කාලය

- පූර්ණ කාලීන (Full time)
- කෙටි කාලීන (Part time)



උදා: කාර්යාල සේවකයන්, ගුරුවරු, බැංකු සේවකයන්, කර්මාන්තශාලා සේවකයන්, සාත්තු සේවකයන්......

| | |
|---|---|
| **රැකියාව** | කෙටිකාලීනව ව්‍යාපෘතිවල රැකියාව කිරීම. |
| **කොන්ත්‍රාත්තු වර්ගය** | ව්‍යාපෘතියකි<br>(යම් කාල වකවානුවකට යටත්ව ස්වාමියා හා සේවකයා අතර සහයෝගිතාවය තහවුරු කරන ගිවිසුමකි.) |
| **රැකියා කාලය** | ස්ථිර කාල වේලාවන් නැත.<br>(කාල වේලවන් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව වෙනස් වේ.) |

උදා: ඕනෑම ක්ෂේත්‍රයකට සේවකයන් හෝ සේවා සැපයීම.

scuolemigranti

**රැකියාව**

**ස්වයං රැකියා**

**කොන්ත්‍රාත්තු වර්ගය**

සේවකයන් හට ස්වාමියකු නොමැති අතර තම පාරිභෝගිකයන් හට තමන් විසින්ම සේවය සලසයි.

**රැකියා කාලය**

රැකියා වේලවන් තමන් විසින්ම තීරනය කරනු ලබයි.

උදා: කර්මාණ්ත ශිල්පියා, කඩ සාප්පු හිමිකරු, වෘත්තීය වෙදියා

නමුත් කඩ සාප්පු හිමිකරු (සිල්ලර වෙළෙන්දාට) තමාගේ සේවා ස්ථානය ආරම්භ කරන සහ අවසන් කරන වේලාවන්ට අනුකූලව කටයුතු කල යුතුය.

scuolemigranti

# වෘත්තීය සංගම්

සාමුහික සහ ආර්ථික ලාභ ප්‍රයෝජන වෙනුවෙන්, සේවක අයිතිවාසිකම් සුරකීම අරමුණු කරගනිමින්, සෑම සේවකයකුටම, සේවක වෘත්තීය සංගමයකට සම්බන්ධ වීමට අයිතිවසිකමක් ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිලිගෙන ඇත.




සේවක වෘත්තීය සමිති වල ප්‍රධාන මෙවලම වී ඇත්තේ, වැඩ වර්ජන හා සේවයට වාර්තා නොකිරීම වේ.

# ඉතාලිය තුල ඇති ප්‍රධාන සේවක වෘත්තීය සමිතීන් කිහිපයක් :

| CGIL | CISL | UIL | UGL |
|---|---|---|---|
| සාමාජිකයන් | සාමාජිකයන් | සාමාජිකයන් | සාමාජිකයන් |
| 6.300.000 | 4.500.000 | 2.200.000 | 1.100.000 |

සාමාජික හෝ සාමාජික නොවන සෑම කම්කරුවකු හටම සේවක වෘත්තීය සමිති සේවා සපයනු ලබයි.

උදා : විශ්‍රාම වැටුප් සඳහා අයදුම් කිරීමට, බදු වාර්ථා සැකසීමට, නීතිමය උපකාර, අනෙකුත් විවිධ අවශ්‍යතා සඳහා උපකාර කිරීම (servizi di patronato) වැනි සේවාවන් සපයයි.

scuolemigranti

# රැකියා සපයන මධ්‍යස්ථාන – Job Centers

C.P.I. (Centri per l’impiego) යනු මහජනතාවට **රැකියා සොයා ගෙනීමට උදව් වන මධ්‍යස්ථාන** වේ.

මෙම මධ්‍යස්ථානය, අදාල පුද්ගලයා මූලික සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන අතර, ඔහුට හෝ ඇයට විරැකියා වූ දින පටන් නිශ්චිත කාල සීමාවක් තුල රැකියා පුහුණුවක් හෝ රැකියාවක් ලබාදීමට කටයුතු කරනු ලබයි.



වැඩි විස්තර සඳහා පහත දුර. අංකය භාවිතා කල හැකියි
**numero verde 800-818-282**

**ස්වයං රැකියවක් ආරම්භ කිරීම** සඳහා පහත දෑ අවශ්‍ය වේ.

1. VAT බදු ගිණුමක් ආර්ම්භ කල යුතුය. (ඉතාලි භාෂාවෙන් PARTITA IVA )
2. 'ව්‍යාපාර ලියපදිංචි කිරීම' (REGISTRO DELLE IMPRESE) යටතේ වාණිජ්‍ය මණ්ඩලයේ (ඉංග්‍රීසි භාෂාවෙන් Chamber of Commerce, ඉතාලි භාෂාවෙන් Camera di Commercio) ලියාපදිංචි කල යුතුය.
3. සෞඛ්‍ය සහ සුභසාධන සහන සඳහා INPS ආයතනය සමග ලියාපදිංචි විය යුතුය.
4. INAIL ආයතනය සමග ලියාපදිංචි විය යුතුය. (අදාල වන අවස්ථාවන් හිදී)
5. අපද්‍රව්‍ය රැගෙනයාම සඳහා බදු ක්‍රියාවලිය ට අදාල කටයුතු ආරම්භ කිරීම සඳහා, ව්‍යාපාරය ආරම්භ කරන බවට, නගර සභාව (COMUNE) දැනුවත් කල යුතුය.

**මේ සඳහා අවශ්‍ය වන වාණිජ්‍ය මණ්ඩලයේ ලිපිනයන්**

**Camera di Commercio,**
Via Capitan Bavastro, 116 - Roma Web Site:
www.rm.camcom.it/



scuolemigranti

# 8 පරිච්ඡේදය

## අධ්‍යාපන ක්‍රමවේදය, ප්‍රායෝගික පුහුණු සහ වැඩිහිටි අධ්‍යාපනය

scuolemigranti

# අධ්‍යාපන ක්‍රමවේදය

## අවුරුදු 6 සිට 16 දක්වා අධ්‍යාපනය ලැබීම අනිවාර්ය වේ.

වයස අවුරුදු 14 වූ පසු, එනම් Scuola Media (Middle School) අවසන් කල පසු, ශිෂ්‍යයන් හට තමාගේ අධ්‍යාපන කොට්ඨාශයේ පවත්වන පිළිගත් වෘත්තීය පාඨමාලාවක් (වසර තුනක්) සඳහා සම්බන්ධ විය හැක. එහිදී ශිෂ්‍යයන් වෘත්තීය පුහුණුවක් ලබන අතර අනිවාර්ය අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාවයද සපුරාලනු ලැබේ.





නගර සභාවට අයත් **බිළිඳු පාසල් (Asili Nido)** -

වයස අවු. 0 සිට 3 දක්වා ළමුන් සඳහා



නගර සභා හෝ රජයේ (ක්‍රීඩා ක්‍රියාකාරකම් සහිතව) **පෙර පාසල් (Scuole dell’infanzia)** -

වයස අවු. 3 සිට 5 දක්වා ළමුන් සඳහා



**ප්‍රාථමික පාසල් (Scuola primaria ) -** වයස අවු. 6 සිට 10 දක්වා ළමුන් සඳහා - පංති 5 කි.



**පළමු අර්ධයේ කණිෂ්ඨ පාසල් (Scuola secondaria di 1° grado)**
වයස අවු. 11 සිට 14 දක්වා ළමුන් සඳහා - පංති 3 කි.

රජයේ විභාගයකින් අවසන් වේ.



**දෙවන අර්ධයේ ජේෂ්ඨ පාසල් (Scuola secondaria di 2° grado)**

වයස අවු. 14 සිට 18 දක්වා ළමුන් සඳහා - පංති 5 කි.

රජයේ විභගයකින් අවසන් වේ.



## දැනගත යුතු වැදගත් තොරතුරු

**පෙර පාසල්** පොදුවේ **«materne»** ලෙස හඳුන්වයි.

**ප්‍රාථමික පාසල්** පොදුවේ **«elementari»** ලෙස හඳුන්වයි.

**පළමු අර්ධයේ කණිෂ්ඨ පාසල්** පොදුවේ **«scuola media»** ලෙස හඳුන්වයි.

**දෙවන අර්ධයේ ජේෂ්ඨ පාසල්** පොදුවේ **«scuola superiore»** ලෙස හඳුන්වයි.

# දෙවන අර්ධයේ ජේෂ්ඨ පාසල්
## (Scuola secondaria di 2° grado)

පහත පාඨශාලා වර්ග ඇතුලත් වේ;
ජේෂ්ඨ පාසල් - high schools, කාර්මික විද්‍යාල - technical colleges, වෘත්තීය පුහුණු පාසල් - vocational schools.

- **දෙවන අර්ධයේ ජේෂ්ඨ පාසල්,** විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කරයි.

- **කාර්මීක විද්‍යාල,** විශ්ව විද්‍යාල ප්‍රවේශය සහ රැකියා පිවිසුම සඳහා අවශ්‍ය සහතික ප්‍රදානය කරයි.

- **කාර්මීක විද්‍යාල,** වසර 3ක පුහුණුවෙන් පසු රැකියා පිවිසුම සඳහා අවශ්‍ය වෘත්තීමය සහතික ප්‍රදානය කරයි. වසර 5ක පුහුණුවෙන් පසු, විශ්ව විද්‍යාල ප්‍රවේශය සහ රැකියා පිවිසුම සඳහා අවශ්‍ය ඩිප්ලෝමා ප්‍රදානය කරයි.



# උසස් තාක්ෂණික අධ්‍යාපනය (Istruzione Tecnica Superiore)

ජේෂ්ඨ පාසල් අධ්‍යාපනයෙන් පසු, විශේෂ වෘත්තීය පුහුණු පාඨමාලාවන් හැදෑරීම සඳහා මෙම ආයතන වෙත යොමු විය හැක. මෙහි පඨමාලාව අවසන් කල පසු EQF (Quadro Europeo delle Qualifiche) නාමය සහිත සහතික පතක් ලැබෙනු ඇත.

- මෙම පාඨමාලා කාලය අවුරුදු 2 ක් වන අතර එය වර්ශාර්ධ (මාස 6 යේ කොටස්) 4 කින් සමන්විත වේ. මුළු කාලය දළ වශයෙන් පැය 2000 කි.



- මේ සඳහා ඇතුලත් වීමට තරඟ විභාගයක් ඇත.
- නිර්දේශිත කාර්මික ආයතනයක් සහිත පදනමක් මඟින් මෙම ITS මධ්‍යස්ථාන පාලනය කරනු ලබයි.

# CTP – Centri Territoriali Permanenti 

මෙය, ඉතාලි සහ විදේශික යන දෙපර්ශවයේම වැඩිහිටියන්ගේ දක්ෂතාවයන් තවත් ඔප් නංවා ගැනීමටත්, සමාජය තුල ඕනෑම රැකියාවක නිරත වීමට අවශ්‍යය කුසලතා වර්ධනය කර ගැනීමටත්, අදාල වන පුහුණු පාඨමලාවන් පවත්වන ප්‍රධාන පෙළේ ආයතනකි.

- සෑම පලාතකම අධ්‍යපන මධ්‍යස්ථාන තුල මෙම ආයතන පවත්වාගෙන යනු ලබයි.
- මෙහි පාඨමාලා සඳහා **සුදුසුකම් ඇති** සෑම විදේශික වැඩිහිටි, ගැහැණු හා පිරිමි, රැකියාවැති හා නොමැති පුද්ගලයන් හට  හා ඉතාලි භාශාව ඉගෙන ගැනීම සඳහා කැමති පුද්ගලයන් හටද ඇතුලත් විය හැක.



මෙහි පවත්වනු ලබන පාඨමාලා නම්:

- ඉතාලි සමාජය සහ සිවිල් නීතිය පිළිබඳ පාඨමාලාව.
- ඉතාලි භාෂාව A2 මට්ටම සඳහා විභාග පැවැත්වීම.
- ඉතාලි භාෂාව A1, A2, B1, B2, C1, C2 මට්ටම් සඳහා පාඨමාලාවන් නොමිලේ පැවැත්වීම සහ හැකි සෑම විටම විභාගයක් පවත්වා, සහතික පතක් නිකුත් කරයි.
- A2 මට්ටම සඳහා නිකුත් කරන සහතික පත්‍රය, CTP පාලනාධිකාරිය විසින් අත්සන් කර ඇති විට, විභාගය කරන ලද ශිෂ්‍යයා, ඉතාලි භශාව අත්‍යාවශ්‍යය ලෙස ඉල්ලා ඇති ඕනෑම අවස්ථාවක නැවත පරීක්ෂන වලට පෙනී සිටීමෙන් නිදහස් වේ.



# විශ්ව විද්‍යාල

විශ්ව විද්‍යාල අධ්‍යාපනය චක්‍ර තුනකින් සමන්විත වෙයි



1. සාමාන්‍ය උපාධිය. කාලය අවු. 3 කි
2. මාස්ටර් උපාධිය. කාලය අවු. 2 කි
3. Phd උපාධි පාඨමාලාව, සාමාන්‍ය උපාධි පාඨමාලාව, මාස්ටර් උපාධි පාඨමාලාවේ දෙවන අදියර සඳහා පාඨමාලා.




9 පරිච්ඡේදය
සෞඛ්‍යය සේවා පද්ධතිය

# ජාතික සෞඛ්‍ය සේවාව

සියලුම පුරවැසියන් **SSN (Servizio Sanitario Nazionale)** හි ලියාපදිංචි විය යුතුය.

සාමාජිකත්වය ලබා ගත් ඔබට ලැබෙන වරප්‍රසාද :



- පවුලේ වෛද්‍යවරයකු තෝරාගැනීමට හැකියාව ලැබේ.
- රෝහලක බාහිර රෝගී අංශයට ඇතුලත් වීමට හැකියාව ලැබේ.
- බෙහෙත් ලබා ගැනීම සඳහා 'බෙහෙත් වට්ටෝරු' ලබා ගැනීමට.
- විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට.

උදා : දන්ත, නාරි හා ප්‍රසව, ළමා රෝග විශේෂඥ වෛද්‍ය වැනි.

- රෝග විනිශ්චය සඳහා පරීක්ෂණ කිරීමට.
- රෝහල් සේවා ලබා ගැනීමට.



# විදේශිකයන් සඳහා ද SSN හි ලියාපදිංචි විය හැක.

- ඔවුන්ට ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය ද «permesso di soggiorno» , නොකඩවා නීත්‍යානුකූලව රැකියාවන් වල නිරත වී ඇතිනම් හෝ රැකියා විරහිත පුද්ගලයකු ලෙස ලියාපදිංචි වී ඇතිනම්.
- ඔවුන්ට ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය ඇතිනම් හෝ එය අළුත් කිරීමේ ක්‍රියාවලිය තුල පවතීනම් හෝ අසරණයන්ට උදව් කරන උපස්ථනාගාරයක පිහිට පතන අයකුනම්.




ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය දෑ :

- ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය «permesso di soggiorno» හෝ එය අළුත් කිරීමේ ක්‍රියාවලිය ට අදාල ලියකියවිලි.
- පදිංචිය සනාථ කිරීමට, තමා විසින්ම දෙනු ලබන සහතිකයක්.
- බදු ලිපිගොනු අංකය «numero di codice fiscale» සනාථ කිරීමට, තමා විසින්ම දෙනු ලබන ප්‍රකාශයක්.

scuolemigranti

එපමණක් නොව, ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රයක්ද, ස්ථිර පදිංචි ස්ථානයක්ද **නොමැති විදේශිකයන්** හටද, සෞඛ්‍යය සේවාව ලබා ගැනීමට **හිමිකමක් තිබේ.**

මෙසේ නීත්‍යානුකූල නොවන, කිසිඳු නීතඅානුකූල ලියකියවිල්ලක් වත් නොමැති විදේශිකයන් හටද, ආසල් **«ASL»** ආයාතනය මගින් ***STP*** *«Straniero in Permanenza Temporanea»* ලෙස නම් කරන ලද කාඩ්පතක් නිකුත් කරයි.




scuolemigranti

එම **STP** *«Straniero in Permanenza Temporanea»* කාඩ්පත ට ලැබෙන වරප්‍රසාද :

- භාහිර රෝගී අංශයෙන් හා හදිසි වෛද්‍ය ප්‍රතිකාර හෝ අත්‍යාවශ්‍ය සේවා, ඒවාගේම දිගටම පවත්නා රෝග සහ හදිසි අනතුරු සඳහා ප්‍රතිකාර.
- දරුවන් සඳහා අනිවාර්යය එන්නත් වැනි රෝග නිවාරක ඖෂධ.
  උදා : ත්‍රිත්ව එන්නත
- පවුල් සැලසුම් සහ ගර්භනී මව්වරුන් සඳහා අවශ්‍යය ප්‍රතිකාර.



scuolemigranti

## ***STP*** *«Straniero in Permanenza Temporanea»* කාඩ්පත :

- විදේශිකයාගේ පෞද්ගලිකත්වය (නම හෙලි නොකරයි) ආරක්ෂා කරයි.
- මාස 6 කට වලංගු වේ. (නමුත් නැවත අළුත් කල හැක)
- එය අදාල දේශ සීමාව තුල පමණක් වලංගු වේ.
- හඳුනා ගැනීම සඳහා ඛේතක අංකයක් භාවිතා කරයි.


REGIONE LAZIO
ASSESSORATO SALVAGUARDIA E CURA DELLA SALUTE

Codice Identificativo: STP120918

*Data di 1° accesso: ___ ___/200_*

SPT කාඩ්පත නිකුත් කලද එමගින් කිසිඳු වගකිවයුතු ආයතනයකට විදේශිකයා පිළිබඳව තොරතුරු හෙලි නොකරයි.

# පවුල් සැලසුම් උපදේශනය

සමාජ සෞඛ්‍යය ව්‍යුහයේ, පවුල් සැලසුම් සායන සැලසුම් කර ඇත්තේ :
පවුල්, කාන්තා, යුවල්, ළමුන් සහ යෞවනයන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට යෝග්‍ය වන පරිධිය.

මෙහිදී සපයන සේවාව, නිවරනයක් (කලින් ආරක්ෂා වීමක්) වන අතර සම්පූර්ණයෙන්ම **නොමිලේ** සපයනු ලබයි.




scuolemigranti

මෙම සායන ලබා දෙන සේවා නම් :

- මනා පවුල් සැලසුමකට අවශ්‍යය උපදෙස් සහ තොරතුරු ලබා දෙයි.
- අනවශ්‍යය ගැබ් ගැනීම් වලක්වා ගැනීම සඳහා අවශ්‍යය මුඛ ඖෂධ සහ වෙනත් කර්මීක උපක්‍රම ලබා දෙයි.
- මනෝ ලිංගික උපදේශන.
- ජානමය අවධානම් තත්වයන්ගෙන් මිදීමට සහ අවධානම් සහිත අවස්ථා වලදී ගැබ් ගැනීමෙන් වැලකීමට උපදෙස් ලබා දෙයි.

consultorio familiare

- අඹු සැමියන්ගේ නිසරු බව පිළිබඳව තොරතුරු සපයයි.
- ගර්භනීභාවය වලක්වා ගැනීම සඳහා ස්ව කැමැත්තෙන්ම පැමිණෙන අය «l'interruzione volontaria di gravidanza (*I.V.G.*)» , බාල වයස් කරුවන් හට වුවත් අවශ්‍යය වෛද්‍යය පහසුකම්, මනෝ වෛද්‍යය උපදෙස් ලබා දීම.
- කාන්තා ප්‍රජනන පද්දතිය ආශ්‍රිත පිලිකා වලක්වා ගැනීමට අවශ්‍යය කටයුතු කරයි.

**උදා :** වෛද්‍යය වරයකු මුණ ගැසීමට, PAP පරීක්ෂණය සඳහා, පියයුරු පරීක්ෂණ හා තමන් විසින්ම පරික්ෂා කර ගත හැකි ශිල්පීය ක්‍රම.



- ඝර්භනී භාවය පරික්ෂා කර ගැනීමට සහ ඒ සඳහා සූදානම් වීම සඳහා අවශ්‍යය දැණුම ලබා දෙයි.

# හදිසි අනතුරු අංශය.

**118**

- සියළුම තදබල සහ හදිසි සෞඛ්‍යය තත්ත්වයන් සඳහා, ඕනෑම ජංගම හෝ ස්ථිර දුරකතනයකින් මෙම අංකය ඇමතිය හැක.
- මිනිත්තු කිහිපයක් ඇතුලත, ගිලන් රථයක් (Ambulance) පැමිණෙනු ඇත.

හදිසි තත්ත්වයකදී, ඕනෑම අයකුට තමන් විසින්ම, රෝහල තුල ඇති හදිසි අනතුරු අංශයට ඇතුලත් විය හැක.




රෝහලට ලඟා වූ වහාම, රෝගයේ බරපතල කම අනුව වෛද්‍යය වරයකු මුණ ගැසීම සහ ප්‍රථමාධාර සඳහා කලර් කෝඩ් (colour code) එකක් ලබා දෙනු ලබයි.

**CODICE ROSSO (RED COLOUR CODE)** : ක්ෂනිකව ප්‍රතිකාර ආරම්භ කරයි.

**CODICE GIALLO (YELLOW COLOUR CODE)** : (හදිසි තත්ත්වයකි) විනාඩි 10 15ත් ඇතුලත ප්‍රථිකාර ආරම්භ කරයි.

**CODICE VERDE (GREEN COLOUR CODE)** : (ඉතා හදිසි තත්ත්වයක් නොවේ) ජීවිතයට තර්ජනයක් නොමැත.

**CODICE BIANCO (WHITE COLOUR CODE)** : හදිසි තත්ත්වයක් නොමැත.

scuolemigranti




# 10 පරිච්ඡේදය

# ඉතාලි භූමිය තුල වලංගු ලේඛන

scuolemigranti

# ඉතාලි භූමිය තුල වලංගු ලේඛන

ඉතාලි භූමිය තුල වැදගත් සහ වලංගු ලියවිලි නම් :

- la *Carta di Identità* (C.I.) - හැඳුනුම්පත (Identity Card)
- il *Codice Fiscale* (C.F.) - පිස්කල් / බදු කේත අංකය
- la *Patente di guida* (PAT.) - රියදුරු බලපත්‍රය (driving licence)

වැදගත් අනෙකුත් ලියකියවිලි නම් “ඉතාලි ජාතික සෞඛ්‍ය සේවාව” සමඟ ලියාපදිංචි වූ කාඩ් පත (Tessera sanitaria) හා විදේශ ගමන් බලපත්‍රය (Passaport) වේ.



# හැඳුනුම්පත (Identity Card) - La *Carta di Identità*




මෙය පුද්ගලයා හඳුනා ගැනීමට භාවිතා කරන ලේඛනයකි

මෙහි අඩංගු වන තොරතුරු නම් : විවාහක අවිවාහක බව, පුරවැසිභාවය, රැකියාව සහ අනෙකුත් පුද්ගලික තොරතුරු.

මෙය සෑම වසර 10ක ටම වරක් අළුත් කල යුතු වන අතර, පිටරට සංචාර සඳහා මෙය භාවිතා කල **නොහැක**.

# නීත්‍යානුකූලව ඉතාලිය තුල පදිංචිව සිටින විදේශිකයන් හට හැඳුනුම් පත සඳහා ඉල්ලුම් කල හැක.

තමාගේ ප්‍රදේශයේ හැඳුනුම් පත් සාදන ස්ථානයෙන් මේ සඳහා ඉල්ලුම් කල යුතුවේ.



මේ සඳහා අවශ්‍ය වන දෑ :

- ඡායාරූප 3ක්.
- හඳුනා ගැනීම සඳහා ලේඛනයක්.
- කල් ඉකුත් නොවූ, ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය (permesso di soggiorno) හෝ පොලීසිය (Questura) විසින් පලමුව නිකුත් කරන ලද නුල්ලා ඔස්තා (nulla osta ) නම් වූ ලියවිල්ල.

scuolemigranti

# පිස්කල්/බදු කේත අංකය - il Codice Fiscale

මෙය වනාහි, පුද්ගලයකුගේ සියළුම පරිපාලන කටයුතු වලට සහ බදු කටයුතු සඳහා තොරතුරු ලබා ගන්නා එකම ලියවිල්ල වේ.




මෙය ලබා ගැනීම සඳහා, ආදායම් පරිපාලන ආයතනය (Uffici delle Agenzie delle Entrate ) වෙත ඉල්ලුම් කල යුතුයි

මේ සඳහා ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය (permesso di soggiorno) හා වලංගු ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක් (photo copy) ඉදිරිපත් කල යුතුය.

scuolemigranti

# රියදුරු බලපත්‍රය(Driving Licence) - la *Patente di guida*

සියලුම මෝටර් වාහන ප්‍රසිද්ධ මර්ග වල ධාවනය සඳහා වලංගු ගමන් බලපත්‍රයක් තිබීම අනිවාර්ය වේ.






න්‍යායික (ලිඛිත) සහ ප්‍රායෝගික පරීක්ශනයකින් පසු මෙය නිකුත් කරයි.

scuolemigranti

රියදුරු බලපත්‍රය ලබාගැනීමේ ක්‍රියාවලිය කොටස් 2 කින් සමන්විත වේ.

මාර්ග නීති රීති, මාර්ගය තුල නිවැරදිව හැසිරිය යුතු ආකාරය වැනි දෑ අඩංගු න්‍යායාත්මක ප්‍රශ්ණ පත්‍රය.

ප්‍රායෝගික ධාවන විභාගය.




(හරි, වැරදි) ප්‍රශ්ණ 40 කින් සමන්විත වෙයි. එයින් අවම වශයෙන් ප්‍රශ්ණ 36 කට වත් නිවැරදිව පිලිතුරු ලබා දිය යුතුය (එනම් වැරදීම් 4කට වඩා අඩු විය යුතුය).

scuolemigranti

රියදුරු බලපත්‍රයක් සඳහා අයදුම් පත, මෝටර් රථ දෙපාර්තමේන්තුවට අයත් කාර්යාලයකට (Uffici della Motorizzazione) බාර දිය යුතුය.

මේ සඳහා අවශ්‍යය දෑ :

- මෑතකදී ගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 2ක්, ඉන් 1ක් සහතික කර තිබිය යුතුයි.
- මාස තුනකට වඩා කල් ඉකුත් නොවුනු, පිලිගත් වෛද්‍යවරයකුගෙන් ලබා ගත්, ඡායාරූපයක්ද සහිතව, මුද්දර ගසන ලද වෛද්‍යය වාර්ථාවක් සහ එහි පිටපතක්.
- මුදල් ගෙවන ලද කුවිතාන්සිය. : € 24,00 sul c/c 9001 සහ € 14,62 sul c/c 4028 )

යුරෝපයට අයත් නොවන අයදුම්කරුවන් පහත ලේඛන වලින් එකක් , අයදුම් පත සමඟ ඇමිණිය යුතුය.

ඉතාලිය තුල නීත්‍යානුකූලව විසීමේ බලපත්‍රය (permesso di soggiorno) හෝ අළුත් කිරීම සඳහා බාරගත් බවට ලැබෙන රිසිට් පත (බැලීම සඳහා)

scuolemigranti

# 11 පරිච්ඡේදය

## නිවාස, මුදලට සහ බද්දට ගැනීම




scuolemigranti

# දේපල බද්දට ගැනීම / 1 නිවාස



නිවාස බද්දට ගැනීමේදී, කොන්ත්‍රාත් වර්ග 2ක් අත.

- දෙපාර්ශවයම කතිකා කරගත් කුලී මුදලකට යටත්ව (a canone libero)
- ප්‍රාදේශීය සභා ආයතන මගින් නියම කර ඇති කුලී මුදලකට යටත්ව (a canone concordato)

A CANONE LIBERO - ගෙවල් හිමියා සහ කුලී නිවැසියා යන දෙපාර්ශවයටම නිදහසේ කුලී මුදල කතිකා කර, එකඟ විය හැක. අවම කොන්ත්‍රාත් කාලය අවු. 4කි. එම නිවස එහි හිමිකරුට පදිංචියට අවශ්‍යය වී නම් හෝ එම නිවාසය විකිණීමට ඇති අවස්ථාවක වැනි, විශේෂ හේතුවක් නොමැති නම් නැවත අවු. 4ක කාලයකට නිරායාසයෙන්ම කොන්ත්‍රාත්තුව අළුත් වේ.

scuolemigranti

# දේපල බද්දට ගැනීම / 2

A CANONE CONCORDATO - මාසික කුලිය, ප්‍රාදේශීය සභා ආයතන මඟින් නියම කර ඇති මිල ගනන් අනුව වන අතර, ගෙවල් හිමියා සහ කුලී ගැණුම් කරුවා යන දෙපාර්ශ්වයම එම මුදලට එකඟ විය යුතුය.

මෙමඟින් දෙපාර්ශ්වයටම බදු සහන ලබා ගත හැක.

සාමාන්‍යයෙන් කොන්ත්‍රාත් කාලය අවු. 3 කි. Canone libero හි සඳහන් වූ හේතුන් නොමැතිනම් මෙම කොන්ත්‍රාත්තුව නැවත අවු. 2 කට නිරායාසයෙන්ම අළුත් වෙයි.


Mod. F23
AGENZIA DELLE ENTRATE
MODELLO DI PAGAMENTO: TASSE, IMPOSTE, SANZIONI E ALTRE ENTRATE
1. VERSAMENTO DIRETTO AL CONCESSIONARIO DI: PERUGIA
2. DELEGA IRREVOCABILE A: POSTE ITALIANE
AGENZIA/UFFICIO: PONTE S. GIOVANNI PROV. PG
PER L'ACCREDITO ALLA TESORERIA COMPETENTE
3. NUMERO DI RIFERIMENTO (*) 1 4 6 5 9 4 / B X 6 5 9 0 2 2 4 5

DATI ANAGRAFICI

4. COGNOME, DENOMINAZIONE O RAGIONE SOCIALE: SAVASTANO — NOME: LUIGI — DATA DI NASCITA: 0 4 0 6 1 9 6 8
SESSO M o F: M — COMUNE (o stato estero) DI NASCITA / SEDE SOCIALE: VIESTE — PROV.: F G — CODICE FISCALE: S V S L G U 6 8 F 0 4 L 8 5 8 U

5. COGNOME, DENOMINAZIONE O RAGIONE SOCIALE: MICHELE — NOME: VERDI — DATA DI NASCITA: 0 5 0 1 1 9 7 5
SESSO M o F: M — COMUNE (o stato estero) DI NASCITA / SEDE SOCIALE: CERNUSCO SUL NAVIGLIO — PROV.: M I — CODICE FISCALE: V R D M C H 7 5 A 0 5 M 5 3 2 X

DATI DEL VERSAMENTO

6. UFFICIO O ENTE: 8 7 3 (codice) 2 2 (sub. codice (*)) — 7. COD. TERRITORIALE (*): T E R 4 — 8. CONTENZIOSO: 2 — 9. CAUSALE: R P — 10. ESTREMI DELL'ATTO O DEL DOCUMENTO (Anno / Numero): 2 0 1 1 S 3 - 4 5 1 2
11. CODICE TRIBUTO — 12. DESCRIZIONE (*) — 13. IMPORTO — 14. COD. DESTINATARIO

කොන්ත්‍රාත්තුව අත්සන් කර දවස් 30ක් ඇතුලත එය ආදායම් බදු කාර්යාලය (Ufficio delle Entrate ) වෙත ඉදිරිපත් කල යුතුය.

වාර්ශික කුලී මුදලෙන් 2%ක් වූ ගෙවිය යුතු බදු මුදල, නිවාස හිමිකරු සහ කුලීකරු අතර සම සමව බෙදනු ලැබේ.

එම මුදල බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින්, F23 නම් වූ පෝරමය පුරවා ගෙවිය හැක.

# දේපල මිලදී ගැනීම

- ගැණුම් කරු විසින් විකුණුම් කරු වෙත, දේපලට මිලක් යෝජනා කරන අතර ඒ සමගම අත්තිකාරම් මුදලක් ද සඳහන් කල යුතුය. (caparra)
- එම යෝජනාව විකුණුම් කරු පිළිගන්නේ නම්, විකිණීමට පොරොන්දු වෙමින් (promessa di vendita) මූලික ගිවිසුමක් ඇතිකර ගනියි. මෙහිදී, ගැණුම්කරු අත්තිකාරම් මුදල ගෙවිය යුතුය.
- විකුණුම් ගිවිසුම බල සහිත වීමට නම්, එය රජයේ නොතාරිස් වරයකු ඉදිරියේ කල යුතුය. (මෙහිදී නොතාරිස් වරයා විකුණුම්කරයේ වලංගු භාවය පිළිබඳව අපක්ෂපාතී රාජ්‍ය නිලධාරියකු ලෙස සහතික කරනු ලැබේ.)
- විකුණුම් ගිවිසුම 'ඔප්පුව' හෙවත් "Rogito" ලෙස හඳුන්වයි.
- ගැණුම් කරු, මූලික ගිවිසුමේ පොරොන්දු වූ පරිදි මුළු මුදල ගෙවිය යුතුය.
- නිවසක් මිලදී ගත් ඔබ, බදු ගෙවීමේ ක්‍රියාවලියටද සම්බන්ධ වේ.






scuolemigranti



# 12 පරිච්ඡේදය

## සමාජ සුරකුම් ක්‍රමවේදය

scuolemigranti

# සමාජ සුරැකුම් ක්‍රමවේදය

විශ්‍රාම වැටුප් ක්‍රමවේදය, පහත අයවලුන් සඳහා අනුග්‍රහය දක්වයි :

- වයස සම්පූර්ණ වූ නිසා සේවයෙන් ඉවත් වීම:
  මහළු වීම නිසා විශ්‍රාම ලැබීම. *«pensioni di vecchiaia»*

- දායක මුදල් ගෙවා අවසන් වූ විට සේවයෙන් ඉවත්වීම :
  ජ්‍යෙෂ්ඨත්වය නිසා විශ්‍රාම ලැබීම. *«pensioni di anzianità»*




scuolemigranti

- සම්පූර්ණයෙන්ම රැකියාව කිරීමට නොහැකි ලෙස සදාකාලිකව දුබල වීම: ආබාධිත වීම නිසා විශ්‍රාම ලැබීම. *«pensioni di invalidità»*

- රැකියාව කරන තැනත්තාගේ වියෝවීමකදී ඔහුගේ සමීපතම ඥාතියාට ලැබෙන විශ්‍රාම වැටුප : යැපෙන්නන් සඳහා වන විශ්‍රාම වැටුප. *«pensioni ai superstiti»*

- කිසිම ආදායමක් නොලබන හා රැකියාවක් කිරීම සඳහා හැකියාවක් නොමැති පුද්ගලයන් හට ලැබෙන විශ්‍රාම වැටුප : සුභසාධන විශ්‍රාම වැටුප. *«pensioni assistenziali»*

මෙම ක්‍රියාවලිය සඳහා මුදල් ලැබෙන්නේ සේවකයා හා ස්වාමියා යන දෙපාර්ශවයේම දායක මුදල්, විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරන නිසාය.

scuolemigranti

මෙම දායක මුදල් පාලනය කරනු ලබන්නේ, *I.N.P.S. (Istituto Nazionale Previdenza Sociale)* මගින් වන අතර සමහර වෘත්තීමය කණ්ඩායම් වල අරමුදල් පාලනය කිරීම සඳහා වෙනත් සංවිධානද ඇත.

වයස සම්පූර්ණ වූ නිසා සේවයෙන් විශ්‍රාම ලැබීමට «*pensioni di vecchiaia*» සපුරාලිය යුතු දෑ :

- අවම වශයෙන් අවු. 20 ක් වත් දායක මුදල් ගෙවා තිබිය යුතුය.
- 2018 ජනවාරි 1 වැනිදා වන විට (ගැහැණු හා පිරිමි) වයස අවු. 66 ක් සහ මාස 3 ක් වත් සම්පූර්ණ වී තිබීම. මෙය ස්වයං රැකියා කරන්නන්ට ද අදාල වේ.



scuolemigranti

දායක මුදල් ගෙවා අවසන් වූ විට ජ්‍යෙෂ්ඨත්වය නිසා විශ්‍රාම ලැබීමට *«pensioni di anzianità»* සපුරාලිය යුතු දෑ :

- 31/12/1995 ට කලින් දායක මුදල් ගෙවීම ආරම්භ කර තිබිය යුතුය.
- කාන්තාවන් අවු 41 යි මාස 6 ක් ද පිරිමින් අවු 42 යි මාස 6 ක් ද සම්පූර්ණ කර තිබිය යුතුය.



දළ වැටුපෙන් 33% ක් දායක මුදල්ට බැර කරනු ලබයි. මෙහිදී 1/3 ක් සේවකයාගෙන් බැර කරන අතර 2/3 බැර කරනු ලබන්නේ ස්වාමියා විසිනි.

# I.N.A.I.L.

**I.N.A.I.L.** යනු රැකියා ස්ථානයේදී වන අනතුරු පිළිබඳව කටයුතු කරන ජාතික ආයතනයකි.



වැඩ බිමේදී අනතුරට භාජනය වූ පුද්ගලයාගේ ආරක්ෂාව සඳහා රක්ෂණ දෘෂ්ඨිකෝණයෙන් බලා කටයුතු කරයි.




scuolemigranti

රක්ෂණය කිරීම අනිවාර්යය වන අතර, ක්ෂේත්‍රය (කර්මාන්ත ශාලා, සුළු කර්මාන්ත, සේවා සහ වෙනත් ක්‍රියාකාර කම්) අනුව ගෙවිය යුතු මුදල වෙනස් වෙයි.



**රක්ෂණය සඳහා සම්පූර්ණ මුදල ස්වාමියා විසින් ගෙවිය යුතුයි**

නමුත් “para-subordinato” (ව්‍යාපෘති වැඩ) වැනි අවස්ථාවකදී සේවකයා විසින් රක්ෂණ මුදලින් 1/3 ක් ගෙවිය යුතුය.



# 13 පරිච්ඡේදය

# බදු ක්‍රමවේදය

# බදු ක්‍රමවේදය

රජය සහ අනෙකුත් ප්‍රාදේශීය බලධාරීන් (Regioni, Province, Comuni) විසින් මහජනයා ගෙවන්නාවූ දායක මුදල් «TRIBUTI» මගින් ඔවුන්ගේ සියළුම පොදු අවශ්‍යතා හා ඕනෑ එපාකම් සපුරා ලීමට කටයුතු කල යුතුය.

**බදු «Tasse»** : ගෙවිය යුතු වන්නේ, ඔබ විශේෂ කාර්යයන් වල නිරත වනවා නම් පමණි.



උදා : තුවක්කුවක් පරිහරනය සඳහා, දඩයම් කිරීම සඳහා අවසර පත් ලබා ගෙන ඇති විට, රජයේ භූමියක් භාවිතා කරමින් රැකියාව කරන විට....

scuolemigranti

**බදු** ***«Imposte»*** : බදු ගෙවන්නාගේ ආදායමට අනුව ලබාගන්නා මෙම මුදල, රජයෙන් ලබා දෙන සේවා ලබා ගැනීමට බාධාවක් නොවේ.

**සෘජු බදු** ***«Imposte dirette»*** : පුද්ගලයාගේ ආදායමට අනුව ගෙවිය යුතුය.

උදා : IRPEF - තනි තනි පුද්ගලයන්ගේ ආදායම් බදු , IRES - ඒකාබද්ධ ආදායම් බදු, IMU - ගොඩනැගිලි සඳහා බදු හා කුණු සඳහා බදු.....

**වක්‍ර බදු** ***«Imposte indirette»*** : දේපල පවරන, බඩු මිලදී ගන්නා අවස්ථා වලදී.

උදා : IVA, Inp. di Registro, «Bollo» මුද්දර ගාස්තු, වැනි......

පහත මහජන සේවාවන් පවත්වාගෙන යාමට දායක මුදල් ලබා දීම අනිවාර්යය වේ.

- Contributi assistenziali : ආබාධිත තත්වයකට හෝ තුවාලයකට ලක්වීමේ අවදානම මින් ආවරනය කෙරේ.

  උදා : INPS, INAIL

- Contributi previdenziali : විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට.

  උදා : INPS, INPDAP

La dichiarazione dei redditi යනු, තමන් කොපමණ මුදලක් ඉපයූවා ද ඒ අනුව කොපමණ බදු මුදලක් «IMPOSTE» ගෙවන ලද්දේ ද යන්න පුරවැසියන් විසින් අදාල පාර්ශවයන්ට «FISCO» දැණුම් දීම සඳහා සාදන ලියවිල්ලකි.

මෙම ප්‍රකාශය කල හැක්කේ : 730 නම් වූ පෝරමය «Modello 730» පුරවා මැයි මස 2 වන දිනට ප්‍රථම තමා සේවය කරන ස්ථානයට හෝ CAF «(Centro di Assistenza Fiscale)» ආයතනයට බාර දීමෙනි.




scuolemigranti

සෑම වසරකම මාර්තු 15 වන විට සේවා ස්ථානයේ ස්වාමියා විසින්, සේවකයා පසුගිය වසරේ උපයන ලද ආදායමේ සාරාංශය දක්වමින් **CUD** (Certificato Unico Dipendente) ප්‍රකාශයක් ඔහු හට නිකුත් කල යුතුය.

මෙම CUD නම් වූ ප්‍රකාශය 730 පෝරමය සමග ඇමිණිය යුතුය. 730 පෝරමයෙහි එම පුද්ගලයාගේ අනෙකුත් ආදායම් (නිශ්චල දේපල, විවිධ සේවාවන්, කුලී ගෙවීම් ආදියයි) සඳහන් කල යුතුය.




**730 පෝරමය සෑදීම අවශ්‍යය නොවන පුද්ගලයන් :**

- තම එකම ආදායම, රැකියාවෙන් ලබන වැටුප පමණක් නම් හෝ විශ්‍රාමික අයකු නම්.
- ආබාධිත අයකු නම්, යුද්ධයකට පසු විශ්‍රාම ලබා ඇති අයකු, හා එවැනි පුද්ගලයන්...

# සේවාවන් සහ ගාස්තු



Energia elettrica

විදුලි බලය



Gas per cucina e riscaldamento

ආහාර පිසීමට සහ නිවාස උණුසුම් කිරීමට



Telefono fisso

ස්ථිර දුරකථන පහසුකම්



Acqua

ජලය

- අත්‍යාවශයය සේවාවන්, විවිධ වූ ආයතන මගින් පවත්වා ගෙන යයි.
- **CONTRATTI DI FORNITURA** නැමති කොන්ත්‍රාත්තුවක් සක්‍රිය කිරීමෙන් (දුරකථන ඇමතුමක් මගින් හෝ අදාල ආයතනයේ කවුළුවක් වෙත යාමෙන්) මෙම සේවා ලබා ගත හැක.
- ගෙවීම් කලයුතු ආකාරය කොන්ත්‍රාත්තුවේ සඳහන් කර ඇත. සේවාව සඳහා ගෙවිය යුතු මුදල **TARIFFA** ලෙස හඳුන්වයි.
- සේවාවේ සුරක්ෂිත භාවය පිළිබඳව Enti/Autorità centrali හා සේවාව සපයන ආයතනය තහවුරු කරයි.



Rifiuti urbani

නගරය තුල කුණු කසල ඉවත් කිරීම

- ඔබ විසින් බැහැර කරන ඝන අපද්‍රව්‍යය (කුණු කසල) ඉවත් කිරීමට යම් ආයතනයක් අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතුය. මක්නිසාදයත් ඔබ විසින් මේ සඳහා යම් මුදලක් «TASSA» ගෙවන බැවිනි.
- මෙම අපද්‍රව්‍යය එක් රැස් කිරීම හා කලමනාකරණය කරනු ලබන්නේ, නගර සභා «Comuni» මගිනි.
- කලින් කලට එවනු ලබන, තැපැල් කාර්යාලය මගින් ගෙවීම් කල හැකි නිවේදන පත්‍රිකාවක් «bollettino» මගින් මෙය දැනුම් දෙනු ලබයි. මෙම ගෙවීම තැපල් කාර්යාල «Uffici postali» මගින් හෝ සමහර බැංකු මගින් කල හැක.

scuolemigranti

# 14 පරිච්ඡේදය

# ඒකාබද්ධ වීමේ ගිවිසුම සහ ඉතාලිය තුල නීත්‍යානුකූලව රැඳී සිටීමේ බලපත්‍රය (Permesso di Soggiorno)

# ඒකාබද්ධ වීමේ ගිවිසුම

පළමු වරට ඉතාලියට පැමිණෙන සංක්‍රමිකයන් හට 'ඒකාබද්ධ වීමේ ගිවිසුමක්' අත්සන් කල යුතුය.

**මෙය ලකුණු ක්‍රමයකි.**

ලකුණු ලබා ගත හැකි නිර්ණායකයන් කිහිපයක් පහත දැක්වේ.

- ඔබට වෛද්‍යය වරයකු තෝරාගෙන තිබීම - ලකුණු 4
- නිවාස බදු හෝ ගැණුම් ඔප්පුව - ලකුණු 6
- තමා ගේ නගරයේ හා ඉතාලියේ, සංස්කෘතික වටිනාකම් පිළිබඳ දැනීම - ලකුණු 15
- ඉතාලි භාශාව පිලිබඳ දැනීම (අවම මට්ටම livello A2) - ලකුණු 24



යම් අයකු දඩ මුදලකට හෝ සිර දඬුවමකට යටත්ව වැරදි කරුවකු වූ විට, මෙම **ලකුණු කපා හරිනු ලැබේ.**




scuolemigranti

මේ සඳහා ලියාපදිංචි වීමේදී පළමුව ලකුණු 16ක් හිමිවේ.

පළමු අවු: 2 ක තුල දී, ඔහු හෝ ඇය විසින් ළකුණු 30 කට ලඟාවී ඇති බව පෙන්විය යුතුය. ඉතාලි භාශාව A2 මට්ටමට ඉගෙන ගෙන තිබීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වටිනාකම්, ඉතාලි ජන සමාජය තුල පවතින ආචාර ධර්ම වැනි දෑ පිළිබඳව දැණුවත් වී තිබීම මගින් මෙම ලකුණු කරා ලඟා විය හැක.



මෙම වසර 2 ක තුල දී, ඔහු හෝ ඇයට ළකුණු 30කට ලඟාවීමට නොහැකි වී ඇතිනමුත්, ඔහු හෝ ඇය සතුව ළකුණු 0ට වඩා ඇතිනම්, ළකුණු රැස්කර ගැනීම සඳහා තවත් අවුරුද්දක කාලයක් ලබා දෙයි.

scuolemigranti

මෙම දික් කරන ලද අවුරුද්දක කාලය තුල දී, ඔහු හෝ ඇය ළකුණු 30 කට ලඟා විය යුතුමය. නමුත්, ඉතාලි භාශාව A2 මට්ටමට ඉගෙනගෙන තිබීම සහ "ඉතාලි පුරවැසියකු වීම සඳහා සිවිල් නීතිය, ඉතාලි සමාජය පිළිබඳ පාඨමාලාව" යන පාඨමාලාව හදාරා තිබීම ද අනිවාර්යය වේ.

"ඉතාලි පුරවැසියකු වීම සඳහා සිවිල් නීතිය, ඉතාලි සමාජය පිළිබඳ පාඨමාලාව" යන පාඨමාලාවට සහභාගි නොවීම නිසා ළකුණු 15 ක් අහිමි වේ.

තෙවන අවුරුද්ද තුලදී ද ළකුණු 30 ක් ලබා ගැනීමට අසමත් වුවහොත්, ඔහු හෝ ඇයගේ ඉතාලිය තුල රැඳී සිටීමට ඇති බලපත්‍රය අළුත් නොකරන අතර රටින් පිටුවහල් කෙරේ.



ප්‍රෙෆෙත්තුරා (Prefettura) ආයතනය මගින් පවත්වන **"ඉතාලි පුරවැසියකු වීම සඳහා සිවිල් නීතිය, ඉතාලි සමාජය පිළිබඳ පාඨමාලාව"** යන පාඨමාලාවට සහභාගි වීම නිසා මුලින් ලබා දෙන ළකුණු 16 න් 15 ක් රැකගත හැකි වෙයි.

ඉතාලි භාශාව A2 මට්ටමට ඉගෙන ගෙන තිබීම නිසා ලැබෙන ළකුණු 24 ලබා ගැනීම සඳහා, Centri Territoriali Permanenti (CTP) මධ්‍යස්ථානයක හෝ එම මධ්‍යස්ථාන හා සමඟ ඒකාබද්ධව කටයුතු කරන ස්වේච්ඡා පසලක් සමඟ ඔබට ඉතා පහසුවෙන් නොමිලේ ලියාපදිංචි විය හැක.

පාඨමාලාව අවසානයේ ලැබෙන සහතික පත්‍රය, Permesso di soggiorno ලබා ගැනීම සඳහා පමණක් භාවිතා කල හැක.

දැනටමත්, මෙම දෙවර්ගය මගින් ඔබගෙන් බලාපොරොත්තු වන තත්ත්වයන් ඔබ සම්පූර්ණ කර ඇති අතර, ඔබට අවශ්‍යය කරන ළකුණු 30 ට වඩා ඔබ ලබාගෙන ඇත.




ඒ වගේම මුදල් ගෙවාද විභාගය සඳහා පෙනී සිටිය හැකි අතර, එහිදී ලැබෙන සහතික පත, Permesso di soggiorno ලබාගැනීම මෙන්ම අනෙකුත් පාඨමාලාවන් සඳහා ඇතුලත් වීමට හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා ද

# දීර්ඝ කාල සීමාවකට ලැබෙන කාර්තා දි සොජ්ජෝර්නෝ
# Carta di soggiorno di lungo periodo

විදේශිකයකු ඉතාලිය තුල අවු. 5 කට වැඩි කාලයක් නීත්‍යානුකූලව ජීවත් වී ඇතිනම්, ඔහුගේ වාර්ශික ආදායමේ අස්සෙඤ්ඤො සොෂාලේ අගය (යූරෝ 5143) ට වඩා වැඩි නම්, ඔහු නීතිය ඉදිරියේ වැරදිකරුවකු වී නොමැතිනම්, පහත අයවලුන් සඳහා ඔහුට කාර්තා දි සොජ්ජෝර්නෝ අයදුම් කල හැක.

- ඔහු සඳහා
- අවු 18ට වැඩි භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වෙනුවෙන්
- ඔහුගෙන් යැපෙන බාල වයස්කාර දරුවන් සඳහා
- ඔහුගෙන් යැපෙන දෙමාපියන් සඳහා

කෙසේ වෙතත්, මෙහිදී අදාල පුද්ගලයා අවම වශයෙන් ඉතාලි භාශාව A2 මට්ටමට වත් වර්ධනය කරගෙන ඇති බව පෙන්විය යුතුය. මේ සඳහා ඉහත 'ඒකාබද්ධ වීමේ ගිවිසුමේ' විස්තර කල ආකාරයටම අධ්‍යාපනික ආයතනයක් හා සමඟ සම්භන්ධ වී කටයුතු කල හැක.

මේ සඳහා ඇති විශේෂ පෝරමය පුරවා, තැපල් කාර්යාලය මගින් අයදුම් කල හැක.

## දීර්ඝ කාල සීමාවකට ලැබෙන කාර්තා දි සොජ්ජෝර්නෝ

විදේශිකයා සතුව, ඉතාලි භාෂාව පිළිබඳ ඇති දැනීම පෙන්වීමට සහතික පතක් නොමැති විට, ඔහුට ප්‍රෙෆෙත්තුරා ආයතනය විසින් නොමිලේ පවත්වන විභාගය ට සහභාගි වීමෙන් ද එම අවශ්‍යයතාව සපුරා ගත හැක. මේ සඳහා අයදුම් කරුට පහත වෙබ් අඩවිය තුලින් සෘජුවම ඉල්ලුම් කල හැක.

http://testitaliano.interno.it

ප්‍රෙෆෙත්තුරා ආයතනය විසින් අයදුම් කරුට දවස් 60 ක් ඇතුලත විභාගය සඳහා දැනුම් දෙනු ලැබේ.



**භාෂා දැනීම පෙන්වීමට අවශ්‍ය නොවන අය :**

1) ඉතාලිය තුල අධ්‍යාපනය හදාරා ඇති හෝ වෘත්තීමය සුදුසුකම් ඇති අයවලුන්ට.

2) උසස් අධ්‍යාපනය “alte qualifiche” යන ක්‍රියා පටිපාටියට යටත්ව ඉතාලියට ඇතුලත් වූ අයවලුන් සඳහා.

3) අධ්‍යාපනය හැදෑරීමට බාධාවක් ඇති බව ( වයස, අසනීප තත්ත්වයක් හෝ ආබාධිත තත්ත්වයක්) සනාථ කර රජයේ වෛද්‍යය ආයතනයකින් සහතිකයක් නිකුත් කර ඇති විට.

# තම පවුල සමඟ නැවත එකතු වීම

## Ricongiungimento familiare



විදේශිකයකු අවුරුද්දකට නොඅඩු කාලයක්, යම් අයකු යටතේ රැකියාව කිරීම, ස්වයං රැකියවක් කිරීම හෝ අධ්‍යපනය ලැබීම අරමුණු කර ගෙන පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ ඇතිව හෝ කාර්තා දි සොජ්ජෝර්නෝ ඇතිව ඉතාලිය තුල වාසය කරයි නම්, ඔහුට හෝ ඇයට තම පවුලේ සමීපතමයන් තමන් සමඟ වාසයට එකතු කර ගැනීමට අවසර ඉල්ලිය හැක.





මේ සඳහා අදාල වන පවුලේ සමීපතමයන් නම්:

- තමාගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා.
- තමාගේ හෝ විවාහක භාර්යාවගේ / ස්වාමි පුරුෂයාගේ බාල වයස්කාර දරුවන්, විවාහයට පිටතින් නමුත් තමුන්ගේ දරුවන්, විවාහ වී නොමැති නමුත් තමාගේ දරුවන්, නීතියෙන් වෙන් වූ බාල වයස්කාර දරුවන් (මෙහිදී භාරකාරයන්ගේ අවසරය අවශ්‍යය වේ).
- අසනීප තත්වයක් නිසා තමාගේ කටයුතු තනිවම කරගත නොහැකි වැඩිහිටි දරුවන්.
- තමාගෙන් යැපෙන, මවුබිමේ වෙනත් අයකු සැලකීමට නොමැති, තම දෙමව්පියන්.

scuolemigranti

# ක්‍රියා පිළිවෙල

සම්පූර්ණ කරන ලද අයදුම්පත, ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක් ද, ඉතාලිය තුල වාසය සඳහා ලැබෙන අවසර පත්‍රය (පෙර්මෙස්සො දි සොජ්ජෝර්නො) ද, නවාතැන් ගන්නා ස්ථානය පිළිබඳ ලියවිල්ලක් ද, ආදායම් වර්ථාවක් ද සමඟ ආගමන විගමන කවළුව «Sportello Unico» වෙත බාර දිය යුතුය.

ඉතාලියට ඒමට බලාපොරොත්තු වන පවුලේ පුද්ගලයා, තමාගේ ඥාති සම්බන්ධය පෙන්වන හෝ බාල වයස් කරුවකු බව පෙන්වන හෝ තමා හට රෝගාබාධයක් ඇතැයි ඔප්පු කල හැකි ලියවිලි ඔහු/ඇය ශ්‍රි ලංකාවේ ඉතාලි තානාපති කාර්යාලයට බාර දිය යුතුය.



ඉල්ලුම් පත්‍රය හා ඊට අදාල ලියවිලි බාරගත් බවට ඉතාලියේ ආගමන විගමන කවළුව «Sportello Unico» විසින් රිසිට් පතක් නිකුත් කරයි. මෙය බාරගත් දින සිට දින 90ක් ඇතුලත මෙම කවුළුව විසින් බාධාවක් නොමැති බව දක්වන ලිපිය , "නුල්ල ඔස්ථා" « Nullaosta » නිකුත් කරයි. නැතිනම් ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බව දන්වන අතර ඒ බව තානාපති කාර්යාලයට ද දැණුම් දෙනු ලැබේ.

# තම පවුල සමඟ නැවත එකතු වීම

මෙම දින 90ට පසු, ඉතාලියට ඒමට බලපොරොත්තු වන පවුලේ ඥාතියා, ඉතාලියේ 'ස්පොර්තෙල්ලො උනිකො' මගින් නිකුත් කරන ලද ලිපියේ ඡායා පිටපතක් ද, අනෙකුත් ලියවිලි ද සමඟ, ඉතාලියට ඇතුලත් වීම සඳහා ශ්‍රී ලංකාවේ තානාපති කර්යාලය වෙත බාර දිය යුතුය.

ඉතාලියට ඇතුළු වී දින 8ක් ඇතුලත, 'ස්පොර්තෙල්ලො උනිකො' වෙත ඒ බව දැණුම් දිය යුතුය. පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියවිලි බාරදීම සඳහා ඔබව කැඳවන තෙක් ඔබ සිටිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම් පත 'කුඑස්තුරා' «Questura» හි තැපැල් කාර්යාලය වෙත බාර දිය හැක. එවිට තැපැල් කාර්යාලය විසින් රහස් අංක 2 ක් ( user id සහ password ) සහිතව රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ සූදානම් වී ඇතිද යන වග පරීක්ෂා කර ගැනීම සඳහා මෙම රහස් අංක යොදා වෙබ් අඩවියට පිවිසිය හැක.

තම පවුල සමඟ එකතු වීමට «motivi familiari යටතේ» ලබා ගන්නා පෙර්මෙස්සො දි සොජ්ජෝර්නෝ යටතේ ඉතාලිය තුල ජීවත් වන්නකු හට, වෙනත් අයකු යටතේ රැකියාවක් කිරීමට හෝ ස්වයං රැකියාවක් කිරීමට හෝ අධ්‍යාපනය හැදෑරීම සඳහා ලියාපදිංචි වීමට හෝ ජාතික සෞඛ්‍යය සේවාව සමඟ ලියාපදිංචි වීමට හෝ හැකියාව ඇත.

scuolemigranti



# 15 පරිච්ඡේදය

## පුරවැසි භාවය

scuolemigranti

# පුරවැසි භාවය

ලබා දෙනු ලබන්නේ :

1) ඔබ නොකඩවා අවු. 10 ක් ඉතාලිය තුල පදිංචි වී ඇති නම්, ඔබට ප්‍රමාණවත් මූල්‍යමය වත්කම් ඇතිනම් සහ සාපරාධි ක්‍රියාවකට වැරදිකරුවකු වී නොමැතිනම්. නමුත් පුරවැසිභාවය ස්වයංක්‍රියව නොලැබේ. මේ සඳහා ඔබ අයදුම් කල යුතුය.



2) ඔබ විදේශික දෙමාපියන්ට දාව ඉතාලිය තුල ඉපදී නොකඩවා අවුරුදු 18 ක් පදිංචිව සිට ඇත්නම්, වයස අවු. 19 පිරීමට පෙර අයදුම් කල යුතුය.

3) ඉතාලි පුරවැසිභාවය සහිත පුද්ගලයකු සමඟ විවාහ වූ විට. විවාහයෙන් පසු ඉතාලිය තුල අවු. 2ක් නීත්‍යානුකූලව පදිංචිව සිටි පසු හෝ ඉතාලියෙන් පිට අවු. 3ක් පදිංචිව සිටි පසු (ඔවුන් දරුවකු බිහිකර ඇතිනම් හෝ දරුකමට හදා ගැනීමට භාර ගෙන ඇත්නම්, මෙම කොන්දේසි අර්ධයකින් අවම වේ.) හා සාපරාධි ක්‍රියාවකට වැරදිකරුවකු වී නොමැති නම්.




scuolemigranti

PRILS LAZIO - PIANO REGIONALE D'INTEGRAZIONE LINGUISTICA E SOCIALE DEGLI STRANIERI NEL LAZIO

*Progetto cofinanziato da*

UNIONE EUROPEA

REGIONE LAZIO

MINISTERO DELL'INTERNO

**Fondo europeo per l'integrazione di cittadini di paesi terzi**

# Corso di educazione civica *Essere cittadini italiani*

**Gennaio 2014**

*Autori:*

scuolemigranti

Rete delle scuole di italiano per l'integrazione linguistica e sociale dei migranti

**Associazioni di volontariato e del privato sociale sostenute da CESV-SPES**

Via Liberiana,17 00185 Roma Tel: 06491340

scuolemigranti@cesv.org www.scuolemigranti.it

| | | |
|---|---|---|
| *Stesura curata da* | : | Francesca Abbate, Daniela Bossa, Valentina Casavola, Daniele Diviso, Fiorella Farinelli, Augusto Venanzetti |
| *Progetto grafico* | : | Francesca Abbate |
| *Traduzione dall'italiano a cura di* | : | *MAKAWITAGE Nadeeka* |

ASAP Agenzia per lo Sviluppo delle Amministrazioni Pubbliche

USR LAZIO

ROMA TRE UNIVERSITÀ DEGLI STUDI

scuolemigranti